# ආරියවංශ රණවීරගේ කාව්‍ය නිර්මාණ දායකත්වය පිළිබඳ කෙටි විමසුමක්

## Brief Critic on the Contribution of Ariyawansa Ranaweera's Poetry

**තිඹිරිවැව සිරිසුමන හිමි**

## Abstract

Ariyawansa Ranaweera holds a prominent place among modern poets. He is a genius poet who engages in poetry in accordance with the tradition of free verse. Ariyawansa Ranaweera, who is inspired by Haiku as well as Muktaka genre of oriental poetry, can be placed in a high position as a creative poet. He, who prefers point of view in certain instances, realistically describes the various domestic problems faced by human beings in his poetic text. Ariyawansa Ranaweera's creative contribution to poetry is studied here in brief, and his poetry and poetic inspiration are investigated.

**Keywords:** Short Measure/Short Metre, Point Of View, Social Commentary, Social Reality, Ideology, Imagination

**සාරසංක්ෂේපය**

නූතන කාව්‍ය නිර්මාණකරුවන් අතර ආරියවංශ රණවීරට ප්‍රමුඛස්ථානයක් ලැබෙයි. හේ නිසඳැස් කාව්‍ය සම්ප්‍රදායට අනුගත ව කාව්‍යකරණයේ යෙදෙන ප්‍රතිභාපූර්ණ කවියෙකි. හයිකු කවියෙන් මෙන් ම පෙරදිග මුක්තක නම් කාව්‍යය ප්‍රවර්ගයේ ද ආභාසය ලබා කාව්‍ය නිර්මාණකරණයේ යෙදෙන ආරියවංශ රණවීර නිර්මාණාත්මක කවියෙකු ලෙස  ඉහළ ස්ථානයක තැබිය හැකි ය. ඇතැම් තැනක දෘෂ්ටි ගෝචර රටාවට ප්‍රිය කරන ඔහු සිය කාව්‍ය පඨිතයෙන් මිනිස් සමාජය මුහුණ දෙන්නා වූ නොයෙක් ගේහසික ප්‍රශ්නය පිළිබඳ ව

යථාර්ථවාදී ලෙස විග්‍රහ කරයි. ආරියවංශ රණවීරගේ කාව්‍යය නිර්මාණ දායකත්වය පිළිබඳ මෙහි දී සංක්ෂිප්ත ව අධ්‍යයනය කරන අතර ඔහුගේ කවි හා කාව්‍ය ආභාසය විමර්ශනයට නතු කෙරේ.

**ප්‍රමුඛ පද :** ජීවන දෘෂ්ටිය, දෘෂ්ටිගෝචර රටාව, පරිකල්පනය සංක්ෂිප්ත රීතිය, සමාජයථාර්ථය, සමාජ විවරණය,

**හැඳින්වීම**

ආරියවංශ රණවීරගේ කාව්‍ය නිර්මාණ දායකත්වයත් කවිමඟ හා කාව්‍ය ආභාසයත් විමර්ශනය කෙරේ. ආරියවංශ රණවීර විසින් රචනා කරන ලද කාව්‍ය ග්‍රන්ථ දාහතරෙන් කාව්‍ය ග්‍රන්ථ නවයක් හා පරිවර්තනය කරන ලද කාව්‍ය කෘති හතරෙන් දෙකක් ද ඉතා සමීප ව අධ්‍යයනය කරමින් මෙම ලිපිය සකසා ඇත.

**ආරියවංශ රණවීර සහ ඔහුගේ සාහිත්‍ය නිර්මාණ**

රාජ්‍ය වර්ෂ 1960 ආරියවංශ රණවීරයන්ගේ දිවියේ හැරවුම් ලක්ෂය යි. මෙම වර්ෂයේ ආරියවංශ රණවීරයෝ පේරාදෙණිය සරසවියට ප්‍රවිෂ්ට වූහ. මේ වකවානුවේ සාහිත්‍ය ප්‍රබෝධය හා ඇල්ම කෙමෙන් වර්ධනය වූ අතර ඔහුගේ සිත ජපන් හයිකු කවිය වෙත ඇදී ගියේ ය. සරසවි අධ්‍යාපනය නිමා කළ රණවීර පාසල් කිපයක ආචාර්යවරයෙකු ලෙස ද රාජ්‍ය පරිපාලන නිලධාරියෙකු ලෙස ද දිගු කාලයක් සේවය කළේ ය.

ආරියවංශගේ කාව්‍ය ජීවිතය ආරම්භ වන්නේ 1980 දශකයේ දී ය. 1984 දී කවි කිහිපයක් නම් සිය කුළුඳුල් කාව්‍ය නිර්මාණය කාව්‍ය ලෝකයට තිළිණ කරන ලදි. **ගේ කුරුල්ලෝ සහ වි කුරුල්ලෝ** (1988) **ඉමක් සහ මලක්** (1992), **ඔයබඩ වවුල්ලු** (1996), **අතු ඉති** (1999) **සම්මිශ්‍රණ** (2006), **එළිමහන් කවි හා ගුහා කවි** (2003), **දොළොස් රළ** (2006), **රළ සමඟ** (2010), **කණිකා** (2003), **තිත්** (1997), **ඉම් පෙදෙස්** (1999), **සඳ ඇබින්ද** (1992), **රළින් රළ** (2013), **දෝතක් කවි** (2008), රණවීරගේ ස්වතන්ත්‍ර කාව්‍ය නිර්මාණයෝ ය. **ලිලැක් මල් මිටක්** (රුසියානු කාව්‍ය), **විසිරිමිණි** (ජපන් කාව්‍ය) **මිණි පැමිණි** (ජපන් කාව්‍ය), **මඟ දෙපස මල්** (චීන කාව්‍ය) ඔහුගේ පරිවර්තන කාව්‍ය

කෘතිහු වෙති. **ඊඩිපස් රජ,**ඇන්ටගනී, **ට්‍රෝජන් ගැහැණු, තිබ නාට්‍ය ත්‍රිකය, ඔරෙස්ටියානු නාට්‍ය ත්‍රිකය,** රණවීරගේ නාට්‍යය පරිවර්තන යි. **රන් රෝස, වනපෙත අඩගසයි, එක්දහස් නවසිය අසූහතර, රන්සුණු** යන කෘති ඔහුගේ ගද්‍ය පරිවර්තන වේ. **ඇමෙරිකානු කවියට පෙර වදනක්, සංස්කෘතිය සහ ගොඩ්සිල්ලාකරණය, අර්නස්ට් හෙමින් වේ සහ ඔහුගේ නිර්මාණ** ඔහුගේ විචාරාත්මක කෘතින් ය. ආරියවංශ රණවීරයන් ස්වතන්ත්‍ර පද්‍ය නිර්මාණයේ මෙන් ම පරිවර්තන කාර්යේ ද නෛපුණ්‍ය ඇත්තෙකි.

සමාජය, ලෝකය, හා පරිසරය දෙස නව්‍ය දෘෂ්ටියක් හෙළන කවියන් කිහිපදෙනා අතුරින් රණවීරයන්ට සුවිශේෂී තැනක් ලැබේ. ආරියවංශ රණවීර පර්යේෂණකාමී නව මං සොයා යන අදීන කවියෙකි. වත්මන් කවියාට ඇති ප්‍රබල ම අභියෝගය වනුයේ ගීතය කෙරෙන් කවිය මුදා ගැනීම යි. උදාහරණයක් ලෙස රත්න ශ්‍රී විජේසිංහ නම් කවියා මර්දනය කරමින් රත්න ශ්‍රී විජේසිංහ නම් ගීත රචකයා ඉස්මතු ව තිබේ. කෙසේ වෙතත් රණවීර ඒ ගීත රචනා ක්ෂේත්‍රය කරා යොමු නො වී කාව්‍යකරණයේ ම නියැළීම නිසා ඔහුගේ කවිවල ගුණාත්මකභාවය තව තවත් වැඩි වී තිබේ. ආරියවංශයන් කාව්‍යය නිර්මාණකරණයට ප්‍රවේශ වන්නේ මැදි වියේ දී ය. එනම් සතළිස් වන විය සම්පූර්ණ වූ පසු ව ය. ජීවිතාවබෝධයෙන් පරිපාක වූ බුද්ධියෙන් හා නව චින්තනයෙන් පුළුල් වූ මනස සෑම විට ම ආරියවංශයන්ගේ කවි නව මාවතක් කරා යොමුකරන ලද බව නිගමනය කළ හැකි ය. මහගම සේකර, නන්දන වීරසිංහ, රත්න ශ්‍රී විජේසිංහ, ආදීන්ගේ කවි මග ගවේෂණය කරන විට දී පෙනී යනුයේ ඔවුන්ගේ කවි ක්‍රමික පරිපාකය කරා පැමිණි බව යි. එහෙත් ආරියවංශ රණවීරගේ කාව්‍යාවලියෙන් පෙනෙනුයේ ආරම්භයේ සිට ම ඔහුගේ කාව්‍යවල සාධනීය ලක්ෂණ දක්නට ලැබෙන බව යි. නව කවි සංග්‍රහයේ දී ආරියවංශගේ කවිමග ඇගයීමට ලක්කර ඇත්තේ මෙලෙසිනි.

''අසූවේ දශකයේදී සිංහල කවි කෙතෙහි තවත් සාරවත් අස්වැන්නක් දකින්නට ලැබේ. ඒ ආරියවංශ රණවීර කවියාගේ නිර්මාණය...මේ පසුබිමෙහි බටහිර කවීන්ගේ කෘතින් මඟින් සිය කාවය දෘෂ්ටිය ගොඩනගා ගත් රණවීර කවියාගේ පැමිණීම සැබැවින්ම නූතන කවියේ අර්ථ සිද්ධියට හේතුවේ''(විජේසූරිය සරත් සහ කරුණාරත්න, 1999:57)

**ආරියවංශ රණවීරගේ කාව්‍ය නිර්මාණවල ආභාසය**

ආරියවංශ රණවීරගේ කාව්‍ය ශෛලිය හා සම්ප්‍රදාය සකස්වීම කෙරෙහි බලපෑ සාධක රාශියකි. ආරියවංශ රුසියානු, චීන, ජපන් හා ඉංග්‍රීසි කාව්‍ය සම්ප්‍රදායන්ගේ හා ශෛලීන්ගේ ආභාසය ඉතා ගැඹුරින් ලබා තිබේ. එසේ ම දේශීය සම්භාව්‍ය කාව්‍ය සාහිත්‍යයෙන් ද ඔහු ඉතා ප්‍රබල ආලෝකයක් ලබා තිබේ. ආරියවංශයන් හයිකු කවියෙකු ලෙස ම පමණක් ව්‍යූහගත කළ නො හැකි ය. ඔහු දේශීය හා විදේශීය සම්ප්‍රදායන්ගේ ප්‍රභාවය මහත් ලෙස ලබමින් සිය කාව්‍යය නිර්මාණ ශක්තිය ගොඩනඟාගෙන ඇති බව විද්‍යමාන වේ. රණවීරගේ කාව්‍ය රීතිය වෙන අයෙකුගෙන් ණයට ගත් එකක් නො ව ස්වාධීන ව ගොඩනඟාගත් රීතියකි.

**සංක්ෂිප්ත රීතිය**

ආරියවංශ රණවීර සංක්ෂිප්ත කාව්‍ය නිර්මාණකරණයට රුචිකත්වයක් දක්වයි. එම කාව්‍ය නිර්මාණවල ජීව ගුණය ඉතා උසස් මට්ටමක පවතී. සංක්ෂිප්ත කාව්‍ය නිර්මාණවලින් ඉතා පැහැදිලි ව හා ක්ෂණික ව ගැඹුරු අදහස් ප්‍රකාශ කිරීම් සිදු කළ හැකි ය. මේ බව වටහාගත් ඔහු සිය කාව්‍ය කෘතිවලට බොහෝ සෙයින් සංක්ෂිප්ත කාව්‍ය සංග්‍රහ කොට ඇත. එසේ ම හයිකු හා පෙරදිග මුක්තක කාව්‍ය ද ඔහුගේ සංක්ෂිප්ත නිර්මාණය කෙරෙහි බලපා ඇත.

සසර

''මලක මෙළෙක මත
නිල මැස්සෙක්
මල් ශාලාවක''

(රණවීර,2006ආඃ22)

''සිල්
දිරා යන
සරුංගලය

බෝ අත්තක

සිල් අරගෙන''

(රණවීර,2006අ:16)

සෑම කවියක ම පාහේ දක්නට ලැබෙන සංක්ෂිප්ත බව 'සසර', 'සිල්' යන කවි දෙක සඳහා දක්ෂ ලෙස මෙහි දී යොදාගෙන ඇති බැව් ධ්වනිත වේ. ආරියවංශගේ කවිවල අතිශයෝක්ති වර්ණනා දක්නට නො ලැබේ. කවිය අනවශ්‍ය ලෙස සක්ක පද යොදමින් දීර්ඝ කිරීම ආරියවංශ ප්‍රිය නො කරයි. ජපන් හයිකු සම්ප්‍රදාය අනුව ලියූ උක්ත කවිවල ස්වරූපය ගත් කාව්‍ය පෙරදිග සාහිත්‍යයේ ද දක්නට ලැබේ. පෙරදිග සම්ප්‍රදාය මුක්තක ලෙස හඳුන්වනුයේ ද මෙය ම වේ. මේ සම්ප්‍රදායට රණවීර බොහෝ සෙයින් ම ප්‍රිය කළ බව ඔහුගේ කෘති සමුච්චයෙන් තහවුරු වේ.

## දෘෂ්ටිගෝචර කාව්‍යය රටාව

ආරියවංශගේ පද්‍ය රචනා අතර දක්නට ලැබෙන අනෙක් සුවිශේෂි ලක්ෂණය වනුයේ දෘෂ්ටිගෝචර රටාව යි. මහගම සේකරගේ හෙට ඉරක් පායයි කාව්‍ය ග්‍රන්ථයේ දෘෂ්ටිගෝචර රටාවට නැකම් කියන කවි නිර්මාණ රණවීරගේ කාව්‍ය ග්‍රන්ථවල පළින් පළ දක්නට ලැබේ.

''වක්කඩ ළඟ දිය

වැටෙන තාලයට

**ත් ට පැන**
**ති තු ඇ වී උඩ නැටුවා**

වැස්ස වසින්නට ඉස්සර

අහසේ වළාකුලෙන් විදුලිය කෙටුවා...''

(සේකර,2000:17)

වක්කඩ ළඟ දිය වැටෙන ස්වභාවය චිත්තජ රූප මවනවා වෙනුවට තිත්ත පැටව් උඩ පනින ආකාරය සන්තානයේ චිත්‍රණය කරනවා වෙනුවට දෘෂ්ටිගෝචර රටාවකින් සහෘදයාට එය ඉදිරිපත් කර ඇත. මෙම දෘෂ්ටිගෝචර රටාවේ ආභාසය ලැබූ රණවීරයන් පාඨකයාට මේ ආකාරයට ඉදිරිපත් කරනු ලබයි.

''තණ පතක් වුව

ඔහු දකින්නේ ඇයි ?

....................................

ඔහු

ඉදීමෙන්

පලක් ඇයි ?''

(රණවීර 2006අ:30)

''ඔ'' අක්ෂරය පමණක් විශාල ලෙස ඉදිරිපත් කරමින් ඔහු යන්න අවධාරණය කිරීමේ මේ දෘෂ්ටි ගෝචර රටාවෙන් බලාපොරොත්තු වූ බව දත හැකි ය. ඔයබඩ වවුල්ලු නම් පද්‍ය පන්තියේ දී රණවීර එල්ලී සිටින වවුල්ලුන්ගේ ස්වරූපය සහෘද සන්තානයේ චිත්‍රණය කිරීම නො කර දෘශ්‍ය චිත්‍රයක් ලෙස දක්නට සලසනුයේ මේ ආකාරයෙනි.

''එල්ලී සිටිති

පත් හැලුණු කුඹුක් ගස්

ඉපල් කොත

යන්තමින්

[illegible]

ඔය බඩ වවුල්ලු''

(ආරියවංශ රණවීර,2006අ:09)

රණවීර දෘෂ්ටිගෝචර රටාව යොදාගත් ආකාරයේ නවතාවක් දක්නට ලැබේ. මෙහි තේමාවේ ගැඹුරක් සූචනය නො වුණ ද කවියාගේ නවමු දාෂ්ටිගෝචර නිර්මාණ රටාව පිළිබඳ පැහැදිලි චිත්‍රයක් සහෘද සන්තානයේ සනිටුහන් වේ. රණවීරගේ පර්යේෂණාත්මක හා ගවේෂණාත්මක කාව්‍ය කුසලතාව ඉහත උදාහරණවලින් ද ඉතාමත් මැනවින් ම නිරූපණය වේ. ආරියවංශ රණවීරගේ සම්මිශ්‍රණ කාව්‍ය ග්‍රන්ථයේ එන 'පහන් ටැඹ' කාව්‍ය නිර්මාණය රචනා කොට ඇත්තේ ද පහන් ටැඹක ආකාරයෙනි.

**කාව්‍ය මාතෘකාකරණය**

ආරියවංශගේ කාව්‍ය නිර්මාණ සමහරක යොදා ඇති මාතෘකාව කවියට වඩා දිගු වූ අවස්ථාවක් දක්නට ලැබේ. ''ලෝකාන්තයෙන් බිමට පැන පහළට ඊයක් සේ වැටෙන තරුණයා තුළ හටගත් ක්ෂණික සිතුවිල්ල''(රණවීර,2010:37) යුදබිම පසුකර සරණාගත කඳවුරට පියා බැලීමට ආ පුතුගෙන් පියා ඇසූ ප්‍රශ්නය (රණවීර,2006:69) ඇතැම් විටෙක සම්භාව්‍ය පද්‍යය පාද සිය නිර්මාණයේ මාතෘකා ලෙස ද යොදා ගනියි. අඳුරෙහි අස්ලොම විදිනට දුරදී විදුලිය පැහැ වැරදුණහොත්

වරදී( රණවීර,2006:15) මෙබඳු දීර්ඝ මාතෘකා යොදමින් නිර්මාණය කරන ලද කාව්‍ය රාශියක් ඔහුගේ කාව්‍ය නිර්මාණවල අන්තර්ගත වේ.

**සමාජ විවරණය**

සමකාලීන සමාජ දේශපාලනික, ආර්ථික, ආගමික අංශයන් පිළිබඳ විමසිලිමත් බවක් රණවීරගේ නිර්මාණවල දැකිය හැකි ය. ආරියවංශ රණවීරගේ කවිවල පිටතින් සරල බවක් දක්නට ලැබේ. එසේ දක්නට ලැබුණ ද සැබැවින් ම එකී සරල දෙය මගින් ඔහු අතිශයින් ගැඹුරු වූ යථාර්ථයක් කරා පාඨකයා යොමු කරවයි. ගස්, මල්, සමනලුන්, සරුංගල් ආදි දේ ඔහු බොහෝ සෙයින් භාවිත කරනු ලබන්නේ සංකේත වශයෙනි. සංකේත භාවිත කිරීම, සංකල්ප රූප භාවිතය හා අපූර්ව පද ගැළපීම රණවිරගේ කවිමගේ සුවිශේෂී ලක්ෂණ වේ. සමාජ යථාර්ථය නිරූපණය කිරීමෙහි ලා රණවීර දක්වනුයේ සහජ දක්ෂතාවකි. ඔහුගේ කාව්‍ය ප්‍රකාශනය වූ කලී අතිශයින් තියුණු වූවකි. එය බුද්ධිමත් සහෘදයාගේ සකලවිධ අහුමුලු කරා ගමන් කරයි. මිනිසාගේ සැබෑ ස්වරූපය කෙබඳු ද යන යථාර්ථය නිරුවත් කරමින් රසිකයන්ට විස්මය දනවන්නට කතුවරයා සමත් ව ඇත. තමා ජීවත්වන සමාජය පිළිබඳ අවබෝධයකින් ගවේෂණය කරමින් කාව්‍යකරණයේ නියුතු බව 'වෙස් මුහුණ', සැබෑ මුහුණ යන කාව්‍යයෙන් සූචනය වේ.

''තද කොට

පැළද ගන්න

යළි

ගිලිහෙන

වෙස් මුහුණ

හනික''

(රණවීර,2006අ:53)

සමාජය දෙස උපහාසාත්මක දෘෂ්ටියක් හෙළන රණවීර සිය සමාජ පරිඥානය මැනවින් ධ්වනිත කරයි. මතුපිටින් විද්‍යමාන ප්‍රියංකර

බවට වඩා රෞද්‍ර වූ ස්වරූපයක් මිනිසාගේ ඇති බව අවධාරණය කරයි. සහෘදයා මෙය කියවීමෙන් ප්‍රඥාව කරා ගමන් කරනු නො අනුමාන ය. ආරියවංශ රණවීරයන්ගේ කවිත්වය සෑම විෂය ක්ෂේත්‍රයක් කරා ම විහිදුණු එකකි. 'යුධ බිම පසුකර සරණාගත කඳවුරට පියා බැලීමට ආ පුතුගෙන් පියා ඇසූ ප්‍රශ්න' මේ මාතෘකාව සැබැවින් ම කාව්‍ය සඳහා යොදන ලද පූර්විකාවක් වැනි ය. රටේ පැවති යුද්ධය අත්දකීම කරගනිමින් සමාජ දේහයේ ප්‍රබල උඩු දුවන ලද ප්‍රශ්නයක් වූ යුද්ධයේ කුරිරු බව මෙයින් කියයි. මානව සම්බන්ධතා බිඳවැටීම හා ආධ්‍යාත්මික සබඳතාවල බිඳවැටීම කවියා මේ කාව්‍යයෙන් ධ්වනිත කරයි. කුරිරු යුද්ධය නිසා වාර්ගික ගැටුම් ඇති වීම ගේ දොර ඉඩකඩම් විනාශ වීම නිසා මිනිසා මුහුණපාන ගැටලුකාරි තත්වය මැනවින් නිරූපණය කරන්නට රණවීර සමත්වෙයි. එය මේ උදාහරණයෙන් තහවුරු වේ.

''මැරිලා ඇති

මැරිලා ඇති

නැතුව

ඉතිරි වෙයිද

ඉතින් ''

(රණවීර,2006අ:69)

ඉහත දක්වන ලද කරුණුවලින් අවධාරණය වන්නේ ආරියවංශයන් සමාජය හා ජනතාව පිළිබඳ සියුම් වූ නිරීක්ෂණයකින් කාව්‍යකරණයේ නියුක්ත ව ඇති බව යි. ධනපති සමාජයේ යකඩ සපත්තුවට නිර්ධනයන් යට වී ඇත. ධනය, කුලය, බලය, රැකියාව යන සාධක අබිමුවේ ඔවුන් අසරණ බවට පත්වන ආකරයත් අසරණ දුප්පත් කතුන් ලිංගික සූරාකෑමට ලක් වන ආකාරයත් ආරියවංශ රණවීර 'සම්මුඛ පරීක්ෂණය' නම් කාව්‍යයෙන් නිරූපණය කරන්නට සමත් ව ඇත. උපහාසය මතු කරන ආරියවංශ බලය හිමි සමාජ පන්තිය කෙබඳු පිළිවෙතක් අනුගමනය කරනුයේ ද යන්න ඉතා හොඳින් ගෙන හැර දක්වීමට සමත් ව ඇත. මිනිසුන් අනුගමනය කරන දෙබිඩි පිළිවෙතට රණවීර නිර්දය ලෙස පහර ගසා ඇත. ධනයෙන් බලයෙන් සුසැදි සමාජය සංස්කෘතිය සදාචාරය සභ්‍යත්වය

යන කරුණු අතින් තිරිසන් තත්වයට පත් ව ඇති බව කවියා සූචනය කරයි. ඉතා ප්‍රබල ලෙස මේ හා බැදුණු සමාජීය ආර්ථික පසුබිම පිළිබඳ කවියා අධ්‍යයනයක යෙදුණු බව ඔහුගේ කාව්‍යයෙන් ගම්‍ය වේ. 'යාචකයා ලේ දන් දෙයි' පද්‍ය පන්තිවලින් උත්ප්‍රාසය ජනනය කරන ආකාරය ඉතා අපූරු ය.

''යාචකයා ලේ දන් දෙයි

මදුරුවනි

දෙන්නට කැමති මුත්

බිඳක් ලේ

මාසතු

ගන්නට සවිමත් ද තුඩ

විද

ඇට බේරුණු

සම?''

(රණවීර,2006අ:57)

සමාජ ආර්ථික දේහය ගිලන් ව ඇති බවත් එම සමාජයේ සාමාන්‍ය ජනයා පීඩාවට පත් ව ඇති බවත් උක්ත පද්‍ය නිරූපණය කරයි. 'බිරිඳ' යන පද්‍ය පන්තියේ ගේහසිකයන්ගේ සැබෑ වූ ප්‍රේමය මෙන් ම ගුණවත් බිරිඳකගේ ස්වභාවය අනගි ලෙස චිත්‍රණය කරන්නට රණවීර සමත් ව ඇත.

පාන්දරින් ම අවම අවදි ව සැමට පළමුව

පොඩි උන් කුද්දා මුව දොවා

සුදු ඇඳුම් අන්දා උන් සිප්හල් යවා

තනා දී මට උදේ තේ කෝප්පය

තකහනියෙන් ඇඳ පැළඳගෙන

බහින්නට පෙර මා එළියට

අතට දී ගැටගැසූ බත්මුල

යටැසින් බලා ඔබ කියයි

අමතක නොකර ගෙන එන විට

ළමයා ගේ පෑණු බේත් ටික

(රණවීර,2006පිටු:68)

හුදෙක්ම බිරියක විසින් ගෙදරදොරේ කටයුතු මෙන් ම දූදරුවන්ගේ කාර්යභාරය ද ස්වාමිපුරුෂයාගේ කාර්යභාරය වෙනුවෙන් ද සිදු කරන කැප කිරීම පිළිබඳව කවියාගේ අවධානය යොමු වී ඇත. ඇයගේ ක්‍රියාකාරීත්වය කැපවීම සහ පරිත්‍යාගය නිසා නිවසේ සියලු කටයුතු සාර්ථකත්වයෙන් සිදු කර ගන්නට හැකි වන බව මෙහි දී අවධාරණය කෙරෙයි. බිරිය දෙස ශුභවාදී දෘෂ්ටිකෝණයක් හෙළීම මෙම කවියා ගේ විශේෂත්වය යි. සමාජයේ සැබෑ යථාර්ථය පිළිබිඹු කරන කාව්‍ය නිර්මාණයක් ලෙස මෙම කවිය හඳුනාගත හැකි ය. මෙයින් පවුල් ජීවිතයේ සාර්ථකත්වය කෙරෙහි භාර්යාවගේ කාර්යභාරය ඉතා සුවිශේෂ බව අවධාරණය කළ හැකි ය.

'කාර්යාල කාර්ය සහායකගේ මරණය' නම් පද්‍යයෙන් ආරියවංශ රණවීර වර්තමාන සමාජයේ පුද්ගලයා ව්‍යාජ ජීවන රටාවකට හුරු වී ඇති බවක් සියල්ල ඉටු කළ යුතු නිසා ම ඉටු කරන බවත් එහි යථාර්ථය එහි හර පද්ධතිය තේරුම් නොගත් බවත් මෙයින් අවධාරණය කෙරේ.

''කෙළි කවට සිනා

මළගෙට හරියටම හැතැප්මයක් මෙහාදී

නතර කොට

පැළැන්දහ

ඔවුහු

සෝක මූණු

.....

හැරී යන විට

නිහඬ රිය තුළ

සෝපත් සැබෑ මූණු

නොවෙනස්වම තිබිණි

හැතැප්මයකට වඩා

බොහෝ දුර''

(රණවීර,2011:43)

සාමාන්‍ය සමාජයේ ජීවත්වන පුද්ගලයන්ගේ යථාර්ථය මැනවින් නිරූපණය කරන්නට කවියා සමත් වී ඇත. සෑම පුද්ගලයෙකු ම තමන් විසින් ගොඩනගාගත් චරිත ව්‍යාජ චරිත බව මෙයින් නිරූපණය කෙරේ. කෙතරම් සමීපතමයෙකු වුව ද ඔහු ජීවත්ව සිටියදී ඔහුට දක්වන පක්ෂපාතී බව හිතවත් බව ඔහුගේ ප්‍රාණය නිරුද්ධ වූ කල ඔහු කෙරෙහි නොපවතින බව මෙයට කදිම නිදසුනකි. බාහිර සමාජයෙන් පුද්ගල ජීවිතයට එල්ල වෙන සමාජ ආර්ථික දේශපාලනික පීඩාව සමනයට පත් කර ගනු වස් ජනයා විසින් තාවකාලික තෘප්තිය සහිත ලෝකයක සැරි සරන බව එම ලෝකයේ සදාකාලික ව ජීවත් විය නොහැකි බවත් එම ව්‍යාජය ලෝකයේ පුද්ගලයා ස්ථානගත වී සිටින බවත් මෙයින් අවධාරණය කෙරේ. ස්වකීයකුගේ අභාවය ස්වකීයයන්ට විනා අන්‍යයන්ට කෙතරම් සමීප සම්බන්ධතා තිබුණ ද ඉතා සුවිශේෂ සිදුවීමක් නොවන බවත් ඔවුන් සිය යුතුකම වගකීම ඉටු කිරීම විනා ඉන් මතුවට කිසිදු කාර්යකට බැඳීමක් නොමැති බවත් මෙයින් අවධාරණනය කෙරේ. සැබැවින් ම වර්තමාන සමාජ දේහයේ

වෙස් මුහුණු පැළඳ ගත් ව්‍යාජ චරිත ජීවත් වන බව ද අවධාරණය කෙරේ.

තමන් අත්දුටු, අත්විඳි දෑ අරුත් ගැන්වීමෙහි ලා රණවීරයෝ සැම විට ම සැඟවී සිටිති. කාව්‍යකරණයේ දී ඔහු අනුගමනය කරනුයේ විනිසුරුවාගේ ක්‍රමවේදය නො ව සාක්ෂිකරුවාගේ ක්‍රමවේදය යි. පෞරාණිකයන් බ්‍රාහ්මාස්වාදයක් ලෙස සලකන ලද කාව්‍ය නිර්මාණවල රස නිපදවීම කෙරෙහි කතුවරයා නොමඳ සැලකිල්ලක් දක්වා තිබේ. රිද්මය, සංක්ෂිප්තභාවය, තේමාවේ ගැඹුර, පද වින්‍යාසය පද ස්ථානගත කිරීම විරිත හා ලය පිළිබඳ සවිඥානික ව කාව්‍යකරණයේ නියුක්ත වූ බැව් නිගමනය කිරීම සාධාරණ ය.

**සමාලෝචනය**

රණවීර අසූව දශකයේ කාව්‍යකරණයට ප්‍රවිෂට වූයේ ය. දේශීය හා විදේශීය කාව්‍ය සම්ප්‍රදායන්ගේ ආභාසයෙන් නවමු කාව්‍ය රචනා ශෛලියක් නිමවා ගත්තෙකි ආරියවංශ රණවීර; සංක්ෂිප්ත බව සරල බව ප්‍රිය කළ ඔහු සිය කාව්‍යයන්ගෙන් අතිශයෝක්තිය මෙන් ම ව්‍යාජත්වය ද පළවා හැරියේ ය. ආකෘතියේ වෙනස්කම් කරමින් නව අත්හදා බැලීම් සිදු කරීමට ඔහු ප්‍රිය කළේ ය. විමර්ශනාත්මක වූත්, ගවේෂණශීලි වූත් නිර්මාණ ශාක්‍යතාව රණවීරගේ නිර්මාණශීලි අනන්‍යතාව ප්‍රකට කරයි. ඔහුගේ ගැඹුරු ජීවන දෘෂ්ටියත් පරිකල්පනයේ නිපුණතාවත් ඔහුගේ සහජ කවීත්වය නිරූපණය කරයි. සමාකලීන සමාජ දේශපාලනික හා ආගමික සංසිද්ධි පාදක කරගනිමින් රණවීර කාව්‍යකරණයේ නියුතු වු බැව් ගම්‍ය වේ. ඔහුගේ කවිමගේ සරල බවක් දක්නට ලැබෙන මුත් එකී සරල බව පරයා ගිය ගැඹුරු බවක් ඔහුගේ බොහෝ නිර්මාණවල දක්නට ලැබේ. සමස්තයක් වශයෙන් සංකල්ප රූප හා සංකේත භාවිතය ඔහුගේ කාව්‍ය සම්ප්‍රදායේ සාධනීය ලක්ෂණයකි. කාව්‍යකරණයේ සහජ දක්ෂතාවක් විදහාපාන රණවීර පුළුල් පරිකල්පනයත් ප්‍රතිභාපූර්ණ කවීත්වයත් පිළිබිඹු කරන බැව් නිගමනය කිරීම යුක්තියුක්ත ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අබේසිංහ, ඩබ්ලිව්, ඒ (2003), **මහගම සේකරගේ කාව්‍ය හා ගීත නිර්මාණ.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

අමරසිංහ, ජයන්ත (2006), **කාව්‍ය සේවනය.** කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

එදිරිසිංහ, ඊ.එම්.ජී. (2008), **දෝතක් කවි ආරියවංශ රණවීරගේ තෝරාගත් කවි එකතුව.** නුගේගොඩ සරසවි ප්‍රකාශකයෝ.

කරුණාරත්න කුසුමා, විජේසූරිය, සරත් (2008), **නව කවි සංග්‍රහය.** පුංචි බොරැල්ල : විජේසූරිය ග්‍රන්ථ කෙන්ද්‍රය.

කුමාරසිංහ, කුලතිලක (1985) **නවකවි සරණිය.** විමර්ශන, නුගේගොඩ, සුභද්‍රාරාම ප්‍රකාශන.

දිසානායක විමල්, **නව කවි සරණිය:** කොළඹ ප්‍රදීප ප්‍රකාශකයෝ.

රණවීර, ආරියවංශ (2006අ) **අතු ඉති.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර, ආරියවංශ (2006ආ), **ඉමක් සහ මලක්, කොළඹ:** ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර, ආරියවංශ (2003) **එළිමහන් කවි හා ගුහා කවි.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර, ආරියවංශ (2006ඇ) **ඔයබඩ වවුල්ලු.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර, ආරියවංශ (2011) **ගේ කුරුල්ලෝ සහ වි කුරුල්ලෝ.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර, ආරියවංශ (2006), **දොළොස් රළ,** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

රණවීර, ආරියවංශ (2005), **මඟ දෙපස මල් (පැරණි චීන කවි).** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර, ආරියවංශ (2010), **රළ සමඟ.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර ආරියවංශ (2013), **රළින් රළ.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර, ආරියවංශ (2006) **විසිරි මිණි.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණවීර, ආරියවංශ (2006ඈ), **සම්මිශ්‍රණ,** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සේකර, මහගම, (2000), **හෙට ඉරක් පායයි.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.